# පැරණි සිංහල විවාහ චාරිත්‍රවලින් නිරූපිත ජන සමාජය පිළිබඳ විමර්ශනයක් (මහාවංශය, සද්ධර්මරත්නාවලිය, දහම්සරණ යන ග්‍රන්ථ ත්‍රිත්වය ඇසුරින් සිදු කරණ ලද අධ්‍යයනයකි)

**දිනීෂා ලියනගේ**

සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
dldenuwan@gmail.com

## හැඳින්වීම

සමාජය පිළිබඳ විග්‍රහයේදී හඳුනා ගත හැකි ප්‍රධානතම සාධක අතර විවාහය ප්‍රමුඛය. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයේ පදනම විවාහය ලෙස හඳුන්වා දිය හැකිය. විවිධ ආගමික සමාජීය පදනම අනුව විවාහය විවිධ ලෙස අර්ථකථන කිරීම් දැකගත හැකිය. විවාහය බොහෝ සමාජවල ආගමික අවශ්‍යතාවයකි. එසේ හඳුන්වනු ලබන්නේ එයට ඇති නීත්‍යානුකූල බව පිළිබඳවයි. නීත්‍යානුකූලත්වයෙහිලා මූලික වශයෙන්ම සලකනු ලබන්නේ චාරිත්‍ර ධර්ම වශයෙන් පවතින කරුණුය.

මෙම අධ්‍යයන මඟින් සිදු කරනු ලබන්නේ පැරණි සිංහල ජන සමාජයේ විවාහ චාරිත්‍ර වලින් නිරූපණය වන එකල ජන සමාජය පිළිබඳ විමර්ශනය කිරීමයි. මෙවැනි අධ්‍යයනයක නිරතවන්නට බලපෑ අධ්‍යයන පසුබිම වන්නේ වර්තමානයේ විවාහ සංස්ථාවට සිදු වී තිබෙන විපර්යාසයන්ය. එහිදී,

- වර්තමානය වන විට සිංහල විවාහ චාරිත්‍ර සම්මිශ්‍රණය වී පැවතීම
- සිංහල විවාහ චාරිත්‍ර යම් ක්‍රියාවක් බවට පමණක් පත්වීම.
- විවාහ චාරිත්‍ර වල ගුණාත්මක ලක්ෂණ වියැකී යෑම.

ආදිය සිදු වී ඇත.

එමෙන්ම පැරණි සිංහල ජන සමාජය දෙස බලන කල පෙනී යන්නේ එම සමාජයේ ජන ජීවිත වලට විවාහය ඉතාමත් වටිනාම අවස්ථාව බවයි. විවාහය සිදු කිරීමට පෙරත් පසුවත් සිදු කරන නොයෙක් ආකාර චාරිත්‍ර එම සමාජය විවාහය දෙදරවා නොයන සමාජයක් බවට පත් කළ ආකාරයත් පවුල් සංස්ථාව සුරක්ෂිත කළ ආකාරයත් හඳුනාගත හැකිය. සමාජ ධර්මතා රැක ගන්නට එකල ජනයා වෙහෙස වී ඇති ආකාරය පැරණි සිංහල විවාහ චාරිත්‍ර අධ්‍යයනයේදී පෙනී යයි.

පැරණි සිංහල විවාහ චාරිත්‍ර මඟින් නිරූපණය වන එකල ජන සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ එම චාරිත්‍ර මගින් ජන සමාජයේ මානුෂීය සම්බන්ධතා වලට වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබා දී තිබෙන ආකාරයයි.

## පර්යේෂණ ගැටලුව

පැරණි සිංහල විවාහ චාරිත්‍ර වලින් එකල ජන සමාජය නිරූපණය වන්නේ කෙසේද?

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනයෙ නිරත වීමට බලපෑ ප්‍රධාන පර්යේෂණ අරමුණු වන්නේ,

- ♦ පැරණි සිංහල විවාහ චාරිත්‍ර වලින් එකල ජන සමාජය නිරූපණය වන ආකාරය අධ්‍යයනය කිරීම.
- ♦ වත්මන් ජන සමාජයේ විවාහ චාරිත්‍ර සංකලනය වී විකෘති ලක්ෂණ ජනිත කරමින් පැවතීමත්,

විවාහ චාරිත්‍ර සමාජයේ ජනතාවගේ ආටෝපවත් ජීවිත විවරණය කරන්නක් බවට ලක් වෙමින් පැවතීමත්, වැනි සාධක තුළ අතීත විවාහ චාරිත්‍ර වල ගුණාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම.

## උපන්‍යාසය

පැරණි සිංහල විවාහ චාරිත්‍ර වලින් එකල ජන සමාජය මැනවින් නිරූපණය වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේදය වන්නේ අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමයයි. ඒ සඳහා පාදක කරගනු ලබන්නේ මහාවංශය ණී සද්ධර්මරත්නාවලිය, දහම්සරණ යන ග්‍රන්ථ ත්‍රිත්වයයි. එම ග්‍රන්ථයන්හි අන්තර්ගතවන පැරණි සිංහල විවාහ චාරිත්‍ර පිළිබඳ සිදුකර තිබෙන සඳහන් කිරීම් අනුසාරයෙන් පර්යේෂණය සිදු කරන ලදී.

## අධ්‍යයන වැදගත්කම

විවාහය වනාහි පවුල් සංස්ථාවේ මූලික අඩිතාලමයි. එමගින් විවාහපත් යුවලගේ සමස්ත ජීවිත කාලයම ශක්තිමත් බැඳීමකින් යුක්තව ගත කිරීමට අවශ්‍යය ශක්තිය අපේක්ෂා කරයි. ආගමානුකූල වශයෙන් ගත්කලද විවාහය සිදුකිරීමේදී කරනු ලබන නොයෙක් ආකාර වත් පිළිවෙත්හි සැඟවුනු යථාර්තය එයයි. අතීත විවාහ චාරිත්‍ර දෙස බැලීමේදී පෙනී යන්නේ එකල විවාහය ප්‍රීතිමත් උත්සවයක් සේම ඔවුන්ගේ සමාජීය ජීවිතය මැනවින් විවරණය කළ චාරිත්‍ර වලට මුල් තැන දුන් උත්සවයක් බවයි. ජන ජීවිතයේ ජාති, ආගම්, කුල යනාදී භේද සහිත සමාජීය ජීවිතය එමගින් කියවිය හැකිය. එමෙන් ඒ සෑම චාරිත්‍රයකට නිශ්චිත පදනමක් ඇත. එම්ගින් විවරණය කරන සමාජ සංස්කෘතික පදනමක් ඇත. වත්මන් ජන සමාජයේ විවාහ චාරිත්‍ර යනු කරන්නන් වාලේ සිදු කරන්නක් බවට පත්ව ඇත. එවන් වකවානුවක මෙම පැරණි සිංහල විවාහ චාරිත්‍ර වලින් නිරූපිත ජන සමාජය අධ්‍යයනය කිරීම කාලෝචිතය.

පැරණි සිංහල ජන සමාජයේ විවාහය ඉතා වැදගත් මෙන්ම ප්‍රශස්ත මට්ටමෙන් සලකන ලද අවස්ථාවක් විය. එය හඳුන්වන ලද්දේ " මංගල්‍යය" යන ගෞරවාන්විත නාමයෙනි මංගල්‍යය යනු ශුභ ක්‍රියාව ණී යහපත ණී ප්‍රශස්ත වූ දෙය යන ලෙස අර්ථ ගන්වන පදයකි. විවාහයේ සියලුම අවස්ථා පැරණි ජන සමාජය තුළදී උත්කර්ශවත් චාරිත්‍ර චාරිත්‍ර වලට මුල්තැන දෙමින් සිදු කරන ලදදේය. එම චාරිත්‍ර වලට මුල්තැන දීම විවාහ අපේක්ෂක සියලු දෙනාගේම අපේක්ෂාව විය. විවාහයේ සියලු අවස්ථා මංගල ගණයෙහිලා ඔවුන්ගේ අභිමානයට පාත්‍ර විය.

"මංගල්‍යය" යන්න පැරණි ග්‍රන්ථ වල වැඩි වශයෙන්ම වාර්තා වන්නේ මෙකී ශුභදායී කටයුතු සම්බන්ධව භාවිතා කරන අවස්ථාවලදීය. එය ඇතැම් විටෙක සී සෑමේ වප් මඟුල, රාජාභිෂේක මංගල්‍යය, ආදී වූ විවිධ අවස්ථාවල භාවිත වචනයකි. '' මඟුලෙන් හෙළා ලූ කප උගුලවන්ට බැරියා සේ'' (සද්ධර්ම රත්නාවලිය පි. 160) යනුවෙන් සද්ධර්මරත්නාවලියෙහි සඳහන් වෙයි.

කෙසේ වෙතත් ජන සමාජයේ දී මංගල්‍යය යනුවෙන් හඳුන්වන ලද්දේ "සරණ බන්ධනය" සඳහාය. සද්ධර්ම රත්නාවලියේදී මෙම සරණ බන්ධනය උදෙසා මංගල්‍යය යනුවෙන් බොහෝ අවස්ථාවලදී භාවිතා කර තිබෙන ආකාරය හඳුනා ගත හැකිය.

'' මඟුල් කොට සරණ පාවාගෙන'' ( සද්ධර්ම රත්නාවලිය )

මංගල්‍යය උදෙසා විවාහ චාරිත්‍ර කෙතරම් දැඩි ලෙස බලපා තිබේද යන්න සද්ධර්මරත්නාවලියෙහි විමර්ෂණයේදී පෙනී යයි. එහිදී, උදේනි රජ සාමාවතිය පාවා ගැනීමේ රිසියෙන් විමසා එවූ කල්හි සෝෂක සිටුවරයාගේ ප්‍රකාශය වන්නේ,

"අපගේ දුවණියන් පාවා නොදෙම්හ, කුමක් පිණිසද යත හොත් අප ගොවීන්ගේ චාරිත්‍ර නම් අපගේ ගැහැණු දරුවන්ට අන්දා කොට වෙහෙසා කියන බසට ලජ්ජා ඇතියම්හ'' ලෙසටය ( සද්ධර්ම රත්නාවලිය පි. 223).

මෙයින් ප්‍රකට වන ප්‍රධානතම ලක්ෂණය වන්නේ ඉහළ සමාජ ස්තරයකට අයත් කෙනෙකු හට සිය දියණියන් පාවා දීමේදී එය උසස් ගෞරවයක් ලැබීමට වඩා සිය කුල සිරිත්වලට හානිකර වූ ක්‍රියාවක් ලෙස ඔවුන් සිතූ බවයි.

කුවේණිය මුණගැසුන ප්‍රථම දින රාත්‍රියේදීම අසන්නට ලැබුණු තූර්ය නාදය පිළිබඳව විජය කුමරු කුවේණියගෙන් විමසූ විට ඇයගේ පිළිතුර වුයේ එය සිරිශවස්තු නම් යක්ෂ පුරයෙහි ජ්‍යෂ්ඨ යක්ෂයාට තම භාර්යා පිණිස ලංකා නගරවාසී වූ කුමාරියක

ගෙන ඒම නිමිත්තෙන් පැවැත්වෙන ආවාහ මංගල උත්සවයක් වන බවයි. '' මහා වංශය 07.34'' මෙහිදී යක්ෂ මනමාලයා මහාකාලසේන වූ අතර මනමාලිය පෝලමිත්තා නම් වූ බවත් මහාවංශ ටීකාවේ සඳහන් ය. මෙහි චාරිත්‍ර සඳහා ගත හැකි ප්‍රධානතම සාධකය වන්නේ මෙම ආවාහ මංගල්‍යය සඳහා කුමාරිකාවගේ මවද පැමිණි බව විශේෂයෙන් සඳහන් කර තිබීමයි. එය එකළ ආවාහ විවාහ චාරිත්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය.

එමෙන්ම විවාහයේ විවිධ අවස්ථාවන්හි ඉටු වූ විවිධාකාර චාරිත්‍ර මාලාවක් පිළිබඳව ද මෙම ග්‍රන්ථ වල දී හඳුනාගත හැකිය. විවාහය සඳහා දෙපාර්ශවයේම එකඟතාවය අත්‍යාවශ්‍යය වූ සාධකයක් විය. එමෙන්ම ලංකාවේ බොහෝ ප්‍රදේශ වල ආවාහ මංගල්‍යවලදී දීග යන මනාලිය ඇරලීම සඳහා ඥාතීන් සමඟ ඇගේ මව මනාලයාගේ නිවසට යන්නේ ද නැත. මහාවංශයේදී එය ''තස්සා මාතාච අගතා'' යනුවෙන් විශේෂයෙන් සඳහන් කර තිබේ. මෙම ආවාහ විවාහ චාරිත්‍ර පිළිබඳ මහාවංශයේ විමර්ශනයේදී පෙනී යන්නේ පැරණි ලක්දිව ආවාහ විවාහ චාරිත්‍ර වලට මුල්තැන දෙමින් සිදු කළ බවයි. එමෙන්ම එම විවිධ විවාහ උත්සව අධ්‍යයනය කිරීමේදී පෙනී යන ප්‍රධානතම ජන සමාජය පිළිබඳව වන සාධක අතර,

- විවාහය චාරිත්‍ර වලට මුල්තැන දෙමින් ඉතා සතුටින් පැවැත් වූ උත්සවයකි.
- කුලය, යන සාධකය ප්‍රධාන වශයෙන් බලපා තිබෙන සාධකයකි.
- එමෙන්ම ඥාති සම්බන්ධතාවලට මුල්තැන ලබා දීම විවාහයේදී අපේක්ෂිත පොදු නිර්ණායකයකි.
- විවාහය තම තමන්ට හැකි උපරිමයෙන් පැවැත්වීමට උත්සාහ දරා තිබේ.

ආදිය පෙනී යයි.

ස්වයංවර විවාහය වැනි අවස්ථා වලදී විවාහ සම්මුතිය සිදු වුයේ තරුණිය විසින් තමන් කැමති තැනැත්තාට මල්දමක් පැළඳ වීමෙනි.

'' ධනවර්ධන සිටු කුමාරයා සඳහා පංච කල්‍යාණියක සොයා ගිය බමුණෝ විශාඛාව හමු වූ මොහොතේ ඇයගේ ගෙලේ මාලාවක් පලඳවා ඇය සිටු කුමරුන්ට නියම කොට ඇති බව සද්ධර්මරත්නාවලියෙහි සඳහන් වේ.

මෙය විශාඛාව විසින් පිළිගැණුනා පමණක් නොව එහිදී ක්‍රියාත්මක වූ චාරිත්‍රයක් පිළිබඳව ද සද්ධර්මරත්නාවලියෙහි සඳහන් වෙයි.

'' පරිග්‍රහය නිසා මාලාව පළඳවා ලූ තැන් පටන් පයින් ගමන් බැරි හෙයින් පොහොසතුන්ගේ දරුවෝ ඉදෝලි, කුහම්, රථ ආදී වූ සැදු වාහනයෙන් යෙති. එක් තරම් වූ කුඩයක් හෝ තල්වැටක් හෝ ඉසට කොට ගෙන යෙති. එයිත් නැත් නම් හැඳගත් කඩින් පටක් හැද ගෙන පටකින් දසරුව වසාගෙන යෙති.'' ( සද්ධර්ම රත්නාවලිය - 393)

මෙයින් එකළ ජන සමජය පිළිබඳ ගෙන එන ප්‍රධානතම සංකේතය වන්නේ එක් විවාහයක් පිළිගත්දා ඇය අරඹයා වෙනත් විවාහ යෝජනා අදාළ කොටනොගන්නා වූ බවයි.

විවාහ මංගල්‍යයක් ස්ථිර වීමෙන් පසුව ඒ සඳහා සුභ දින සහ සුභ නැකැත් තෝරා බේරා ගන්නා ලදී. විවාහය සිදුවන කාල සීමාව පිළිබඳව මෙම චාරිත්‍ර වලදී අධ්‍යයනය කළ හැකිය. එමඟින් ද ඔවුන් නැකැත් පිළිබඳව විමසිලිමත් වූ ආකාරය මැනවින් හඳුනාගත හැකිය.

එහිදී විශේෂයෙන්ම බුද්ධ මංගල්‍යය සිදු වූ නැකත විවාහ මංගල්‍ය සඳහා ද පාදක කර ගැනීමට සිංහල ගැමි ජනතාව පෙළඹුණු බව හඳුනාගත හැකිය. එනම්, සිදුහත් කුමරුගේ පිළිසිඳ ගැනීම් සිදු වූ ඇසළ පුර පසළොස්වක දිනයයි.

'' පුණ්‍ය සිටාණන්, තම දියණියන් සුමණ සිටාණන්ගේ පුතණුවන්ට ඇසළ මස මැදින් පොහොය හිඳුවා පාවා දුන් බව දහම්සරණෙහි කියවේ.'' (දහම් සරණ - 204)

''බහුධන සිටාණන් සිය දියණියන් වූ උත්තරාවන් රජගහනුවර සිටුගේ පුතුට පාවා

දුන්නේ ද ඇසළ මස මැදි පොහොය දී බව සද්ධර්මරත්නාවලියෙන් ප්‍රකට වෙයි.'' ( සද්ධර්ම රත්නාවලිය - 883)

'' නැකත නපුරුය යන හේතුවෙන් භාර්යාවක නොලැබූ පුරුෂයකු පිළිබඳ සිදුවීමක් නක්කත්ත ජාතකය ඇසුරෙන් එන දහම්සරණෙහි දැක්වේ. ( දහම් සරණ - 108)

එමෙන්ම විවාහ චාරිත්‍ර වලදී විශේෂයෙන් සකස් කරණ ලද ශාලා තැනූ බවද ආදී ග්‍රන්ථ විමර්ෂණයෙන් පෙනී යයි.

'' බොහෝ කලඑළි සහිතව මංගල්‍යය කිරීමට වරම් නොලද සාමාන්‍ය ජනයා වුවද සිය ගේ දොර හැකි පමණින් පිළිසකර කර ගත්තාහ. එක්තරා මහළු බමුණන් කෙනෙකුගේ වස්තුවෙහි එන පුවතක් අනුව මංගල්‍යයක් සඳහා ගෙයි ගොම පිරිබස් ගන්වා ඊ මංගල සැරසිලිවලින් හෙබවූ තොරතුරක් සඳහන් ව ඇත.'' ( සද්ධර්ම රත්නාවලිය - 998)

මේ ආකාරයට පැරණි ලක්දිව විවාහය ආශ්‍රිත චාරිත්‍ර පිළිබඳ පැරණි ග්‍රන්ථ විමර්ශනයේදී තොරතුරු රාශියක් හඳුනා ගත හැකිය. විවාහ චාරිත්‍ර අධ්‍යයනයේදී එකල පැවති ජන සමාජයේ සිතුම් පැතුම් පිළිබඳව විමර්ශනය කර ගැනීමද ඉතා පහසුය. එය මූලික වශයෙන්ම,

- එමගින් විවාහපත් යුවළට වගකීම් පැවරූ ආකාරය.
- තම තමන්ගේ ආර්ථික මට්ටම හා සමාජ තත්ත්වය පිළිබිඹු කළ ආකාරය.

ආදිය පිළිබිඹු වේ. මීට අමතරව එකළ ජනයා සතුවන,

- මව්පිය දූදරු සබඳතාවය
- ඔවුන්ගේ හැඟීම් දැනීම්
- ආර්ථික මට්ටම
- ඇඳුම් පැළඳුම් වල ස්වරූපයන්
- නිර්මාණශීලී බව
- අධ්‍යාපන මට්ටම
- රැකියා තත්ත්වය
- සමාජ මට්ටම

ආදී විවිධාකාර සමාජ වපසරියක නිරත වීමට මෙකී අධ්‍යයනය මගින් හැකි විය.

## නිගමන සහ යෝජනා

අධ්‍යයනය මගින් එළඹිය හැකි ප්‍රධාන නිගමනය වන්නේ, පැරණි සිංහල විවාහ චාරිත්‍ර වලින් එකල ජන සමාජය මැනවින් නිරූපණය වන බවයි. එමෙන්ම, මෙම පැරණි සිංහල විවාහ චාරිත්‍ර සිදු කිරීම මගින් සමාජීය සම්බන්ධතා මනාව පවත්වා ගැනීම අපේක්ෂිත මුඛ්‍ය ප්‍රතිඵලයකි. එම චාරිත්‍ර මගින් පැරණි සිංහල ජන සමාජයේ පවුල් සංස්ථාවේ ස්ථාවරත්වය ගොඩනගා ඇත. එම පැරණි සිංහල ජන සමාජයේ පැවති විවාහ චාරිත්‍ර හා සම්බන්ධ සමාජීය සබඳතා බිඳී යාම නිසා වර්තමාන සමාජයේ විවාහ සංස්ථාවට දික් කසාදය වැනි සමාජ ප්‍රශ්න පවා උද්ගත වී තිබෙයි. එය එළඹිය හැකි තවත් නිගමනයකි.

මෙම පැරණි සමාජයේ විවාහ චාරිත්‍ර වල පැවති ගුණාත්මක ලක්ෂණ සහ එම චාරිත්‍රයන්හි අභිමත අරමුණු පිළිබඳව වර්තමාන සමාජයට යම් දැනුවත් භාවයක් ලබාදීම අත්‍යාවශ්‍යය සාධකයකි. එසේ නොවන්නේනම් චාරිත්‍රයන්හි ගුණාත්මක ලක්ෂණ සමාජයෙන් වියැකීයාමේ අවධානමක් ඇත. යන්න අධ්‍යයනය සිදු කිරීමෙන් අනතුරුව සිදු කළ හැකි යොජනාවකි.

### ආශ්‍රේය ග්‍රන්ථ


සද්ධර්මරත්නාවලිය, සංස්: කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ගුණසේන සහ සමාගම, කොළඹ 1961.

දහම්සරණ සංස්: කොත්මලේ ශ්‍රී ධර්මකීර්ති ධම්මානන්ද හිමි, ග්‍රන්ථ ප්‍රකාශන යන්ත්‍රාලය, කොළඹ 1929.

මහාවංශය, පරි: හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ දොන් අන්ද්‍රිස්ද සිල්වා බටුවන්තුඩාවේ, රජයේ මුද්‍රණාලය, කොළඹ, 1912.

පැරණි සිංහල විවාහ සංස්කෘතිය, ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2007.